**ඔපෙක් අරමුදලින් මුල්‍යයනය කරන ඒ 017 මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (රක්වාන- සූරියකන්ද) - 2023**

----------------------------------------------------------------------------------------------------------------

ඔපෙක් අරමුදලින් මුල්‍යයනය කරන ඒ 017 මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (රක්වාන- සූරියකන්ද) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මෙම ව්‍යාපෘතිය 2019 ජනවාරි 01 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණයකට අනුව ක්‍රියාත්මක වේ. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ තොරතුරු අනුව, මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රක්වාන ප්‍රදේශයේ කිලෝමීටර 130.6 න් ආරම්භ කර සබරගමු පළාතේ සූරියකන්ද ප්‍රදේශයේ කිලෝමීටර 112.6 න් අවසන් වන ශ්‍රී ලංකාවේ ඒ 017 මාර්ගයේ කිලෝමීටර 18ක් පුනරුත්ථාපනය කිරීම මෙහි අරමුණ වේ. ව්‍යාපෘතියේ සමස්ථ අරමුණ වනුයේ සම්බන්ධතාව සහ ප්‍රවිශවීමේ හැකියාව වැඩිදියුණු කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ පොදු සමාජ- ආර්ථික සංවර්ධනයට දායකවීම වේ. මාර්ගය දෙපස තද සහ මෘදු උරහිස් සහිත මංතීරු දෙකක අධිවේගී මාර්ගයක් (10.0m) ලෙස සැලසුම් කර තිබුණි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 6,947.2කට සමාන එ.ජ.ඩො මිලියන 50.54 වන අතර ඉන් රු.මිලියන 5,497.9කට සමාන එ.ජ.ඩො මිලියන 40ක් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල මගින් මුල්‍යානයට එකග වී තිබුණි. ණය ගිවිසුම 2019 ඔක්තෝබර් 30 දින අත්සන් කරන ලද අතර 2025 දෙසැම්බර් 25 දින අවසන් වීමට නියමිත වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම යන කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධව විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනැති අවසන් IPC අංක 15 අනුව, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.මිලියන 29.72 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකරගෙන තිබුණි. එසේ වුවද, එය රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව ලෙජර් ගිණුම්වල ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු ශේෂය සහ ගෙවිය යුතු ශේෂය රු. මිලියන 29.72 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 29.32 | එකඟ වේ. ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරනු ලබන අතර තවදුරටත් මෙවැනි දෝෂ වළක්වා ගැනීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා විසින් SLPSAS වලට අනුකූල වන බවට සහතික විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | උපදේශන ගාස්තු රු.මිලියන 50ක් සමාලෝචිත වර්ෂය තුළ ලබා දී තිබුණි. කෙසේ වෙතත්, එය 2023 දෙසැම්බර් 31 දිනට හිමිකම් යටතේ ගිණුම්ගත කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, හිමිකම් රු. මිලියන 50 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර වගකීම් රු. මිලියන 50 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 50 | එකඟ වේ. ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා විසින් SLPSAS වලට අනුකූල වන බවට සහතික විය යුතුය. |
| (ඇ) | මෙම ව්‍යාපෘතිය සඳහා භාවිතා කරනු ලබන ස්ථාවර වත්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබූ බව නිරීක්ෂණය විය. | - | එකඟ වේ. කොන්ත්‍රාත්කරු මාර්ගයෙන් IPC හරහා ඉඩම් අත්පත් කර ගැනීම් කටයුතු සිදුකරනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා 2023 වර්ෂයේ අග භාගයේදී ස්ථාවර වත්කම් මිලදී ගෙන ඇත. මෙය ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ගිණුම් අංශය වෙත දන්වා නොමැති අතර ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා විසින් SLPSAS වලට අනුකූල වන බවට සහතික විය යුතු අතර අදාළ රේඛීය ආයතන සමඟ නිසි සන්නිවේදනයක් පවත්වා ගත යුතුය. |

## 2.2 නොපියවූ ශේෂයන්

| විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | නොපියවූ කාලසීමාව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 2021 වර්ෂයේ සිට ජංගම වගකීම් යටතේ පෙන්වා ඇති රු. මිලියන 31.90 ක ගෙවිය යුතු මුදල් 2023 දෙසැම්බර් 31 දක්වා ද පියවීමට කටයුතු කර නොතිබුණි. | 31.90 | වසර 2 කට වැඩි | එකඟ වේ. 2024 වර්ෂයේදී ගෙවිය යුතු මුදල් පියවීමට කටයුතු කරමින් පවතින අතර දැනට රු. මිලියන 13.1 න් රු. මිලියන 12.0 ක් පියවා ඇත. | ගෙවිය යුතු මුදල් පියවීමට කඩිනම් පියවර ගත යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාද සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය ප්‍රතිශතය | | |
| සිවිල් වැඩ | ඉදි කිරීම් | 45.8 | 39.17 | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් වසර 04 කට පසු 2022 වසර අවසානයේ ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. තවද, ව්‍යාපෘති කාලසීමාව තුළ ව්‍යාපෘති කටයුතු සාක්ෂාත් කර ගැනීමට නොහැකි බව නිරීක්ෂණය විය. | ඉඩම් අත්පත් කර ගැනීම, වෙනත් ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම සහ ප්‍රසම්පාදන කටයුතු සඳහා ණය දෙන ආයතනයෙන් එකඟතාව ලබා ගැනීම මන්දගාමී ලෙස සිදු කෙරුණි. |

**කළමනාකරණයේ ප්‍රතිචාරය**

එකඟ වේ.
ඉඩම් අත්පත් කර ගැනීම සහ වෙනත් ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම වැනි අනෙකුත් ක්‍රියාකාරකම් මන්දගාමී ලෙස සිදු කෙරුණි.
කෙසේ වෙතත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාලනයෙන් පරිබාහිරව ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සඳහා ණය දෙන ආයතනයෙන් එකඟතාවය ලැබීමේ දැඩි ප්‍රමාදයක් පවතී.

**විගණකගේ නිර්දේශයය**

වැඩසටහන කාලානුරූපීයව සංශෝධනය විය යුතු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතු අතර අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි (FIDIC - 1999) හි අංක 4.2 වගන්තියට අනුව කොන්ත්‍රාත්කරු තමාගේම වියදමින් කාර්යසාධන සුරක්ෂණය ලබා ගත යුතුය. කෙසේ වෙතත්, කාර්යසාධන සුරක්ෂණ පිරිවැය සඳහා ව්‍යාපෘතිය විසින් රු. මිලියන 17.4 ක මුදලක් ගෙවා තිබුණි. | එකඟ නොවේ.<br><br>කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසිවල 4.2 වගන්තියට අනුව, ටෙන්ඩරය සඳහා වූ පරිශිෂ්ටයේ වටිනාකම සහ මුදල් වර්ගය දක්වා ඇති නම්, කොන්ත්‍රාත්කරු තම වියදමින් කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගත යුතු බව පැහැදිලිව දක්වා ඇත. එයට පටහැනිව, මෙම පැකේජ තුන සඳහා ප්‍රකාශයට පත් කරන ලද ටෙන්ඩර් ලේඛනවල ටෙන්ඩරය සඳහා | ලංසු ලේඛන ඇගයීමේදී මෙම කරුණු සලකා බැලීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත දැනුම් දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වූ පරිශිෂ්ටයේ වටිනාකම සඳහන් කර නොමැත. මෙම තත්ත්වය තුළ 4.2 වගන්තිය අනුව, ටෙන්ඩරය සඳහා වූ පරිශිෂ්ටයේ යම් මුදලක් සඳහන් කර නොමැති නම් මෙම වගන්තිය අදාළ නොවන බව තවදුරටත් සඳහන් වේ. එබැවින්, කාර්යසාධන සුරක්ෂණය සඳහා ගෙවීම් අයිතමයක් ලබා දී ඇත. කෙසේ වෙතත්, අනාගත කොන්ත්‍රාත් ගිවිසුම්වලදී මෙම ගෙවීම් අයිතමය ඉවත් කිරීමට සටහන් කරගෙන ඇත. | |
| (ආ) | කොන්ත්‍රාත් ගිවිසුමේ පිරිවිතරවල 128 සහ 129 උප වගන්තිවලට අනුව, පවරා ගැනීමේ සහතිකය නිකුත් කරන දිනයේ දී රසායනාගාරය, උපකරණ සහ ගෘහ භාණ්ඩ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දිය යුතු අතර කොන්ත්‍රාත්තුව අවසානයේ මැනුම් උපකරණ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දිය යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය විසින් 2023 දෙසැම්බර් 31 දිනට ක්ෂේත්‍ර රසායනාගාර උපකරණ සහ මිනුම් උපකරණ සඳහා එකවර ගෙවීම් වශයෙන් රු. මිලියන 49.08 ක මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා රු. මිලියන 27ක මුදලක් ව්‍යාපෘතිය ගෙවා තිබුණි. අවාසිදායක කොන්ත්‍රාත් කොන්දේසි මගින් කොන්ත්‍රාත්කරුවන්ට අමතර ප්‍රතිලාභ ගෙන දිය හැකි බව නිරීක්ෂණය විය. | එකඟ නොවේ. මාර්ග සංවර්ධන අධිකාරිය සතුව රසායනාගාර සහ මැනුම් උපකරණ අවශ්‍යතාව ඉක්මවා පවතින අතර ව්‍යාපෘතියේ නිගමනය අනුව නව උපකරණ ලබා ගැනීම අනවශ්‍ය වේ. | ලංසු ලේඛන ඇගයීමේදී මෙම කරුණු සලකා බැලීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත දැනුම් දිය යුතුය. |
| (ඇ) | නියැදි පරීක්ෂණයට අනුව ඉංජිනේරු ඇස්තමේන්තුවල රේටයන් හා සසඳන විට බොහෝ ගෙවීම් අයිතමවල ප්‍රදානය කරන ලද රේටයන් 50% සිට 3042.86% දක්වා සැලකිය යුතු පරාසයකින් වැඩි වී ඇති අතර සමස්ත වැඩිවීම රු. මිලියන 670 ක් වූ බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරු සමඟ තාක්ෂණික ඇගයීම් කමිටුව පැවති සාකච්ඡා සතුටුදායක නොවූ බව මෙයින් පෙන්නුම් කෙරේ. | එකඟ නොවේ. ලංසු ක්‍රියාවලියේ තරඟකාරී ස්වභාවය අනුව, ඉංජිනේරු ඇස්තමේන්තුව ලංසු ඇගයීම සඳහා මාර්ගෝපදේශයක් ලෙස භාවිතා කරනු ලබයි. තවද, ලංසු ලේඛනයේ ලංසු මිල ඇගයීම පිළිබඳ 36 වැනි වගන්තිය අනුව සාකච්ඡා සඳහා ඉඩ නොදේ. තව දුරටත් ඇගයීම් අවස්ථාවේ දී යථාර්ථවාදී නොවන රේටයන් අනෙකුත් ලංසුකරුවන් ඉදිරිපත් කරන ලද රේටයන් සමඟ සංසන්දනය කරනු ලබන අතර සැලකිය යුතු වෙනසක් තිබේ නම්, ලංසුකරුගෙන් හේතු විමසනු ලැබේ. | ඉහළ රේටයන්වලට ප්‍රදානය කිරීමෙන් සිදුවන පාඩු අවම කර ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ICTAD - 2009 විසින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ග සහ පාලම් ඉදිකිරීම සහ නඩත්තු කිරීම සඳහා වන සම්මත පිරිවිතරයන්ට අනුව, අත්තිවාරමේ පදනම සකස් කිරීම සහ ජලය බැසයාමේ ගෙවීම් ඒකකය වෙන් කරන ලද මුදල් (provisional sum) අයිතමයක් වේ. කෙසේ වෙතත්, ඊට පටහැනිව, සියලුම පැකේජවල ඉංජිනේරු ඇස්තමේන්තු එක්වර ගෙවීමක් (lump sum) ලෙස සකස් කර තිබූ අතර, නිසි මිනුම් නොමැතිව ව්‍යාපෘතිය විසින් රු. මිලියන 12.51 ක මුදලක් ගෙවා තිබුණි. | එකඟ නොවේ. වෙන් කරන ලද මුදල් (PS) අයිතමයන් සඳහා ගෙවීම, සමීප අධීක්ෂණයක් ඇතුළත් වැඩබිම්වල සත්‍ය මැනීම මත පදනම් වන අතර එය අක්‍රමිකතාවලට තුඩු දෙන බැවින් එය වෙන් කරන ලද මුදල් (PS) අයිතමයක සිට එකවර ගෙවීම් (LS) අයිතමයක් ලෙස වෙනස් කර ඇත. | පිරිවැය ඇස්තමේන්තුව අනුමත කිරීමට පෙර ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ICTAD කොන්දේසි වලට අනුකූල වන බවට සහතික විය යුතුය. |
| (ඉ) | කොන්ත්‍රාත් ගිවිසුමේ විශේෂ කොන්දේසිවල අංක 14.2(ඇ) උප වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු වෙත සහතික කරන ලද සම්පූර්ණ අතුරු ගෙවීම් අනුමත කොන්ත්‍රාත් මුදලින් සියයට 30 ට ළඟා වූ විට අත්තිකාරම් ගෙවීම් අඩු කිරීම ආරම්භ කළ යුතුය. ව්‍යාපෘතිය මගින් පැකේජ තුනක් සඳහා රු. මිලියන 885 ක අත්තිකාරම් මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අඩු ප්‍රගතිය හේතුවෙන්, අත්තිකාරම් ගෙවීම් අඩු කිරීම මේ දක්වා ආරම්භ කර නොතිබුණි. | එකඟ නොවේ. අත්තිකාරම් ගෙවීම අඩු කිරීම් කොන්ත්‍රාත් ගිවිසුමේ විශේෂ කොන්දේසිවල 14.2 වගන්තියට අනුව සිදු කරනු ලැබේ. කොන්ත්‍රාත් ගිවිසුමේ විශේෂ කොන්දේසිවලට අනුව, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 30% මට්ටම දක්වා ළඟා වූ විට 14.2 (b) වගන්තියට අනුව දෙවන අත්තිකාරම් ගෙවීම සිදු කළ යුතුය. කෙසේ වෙතත්, 14.2(c) වගන්තියට අනුව මූල්‍ය ප්‍රගතිය 30% ඉක්මවන විට අඩු කිරීම ආරම්භ වේ. කෙසේ වෙතත්, අත්තිකාරම් අය කර ගැනීම සිදු වෙමින් පවතින අතර 2024 මාර්තු 31 දිනට A පැකේජය වෙනුවෙන් රු. මිලියන 68.0ක්, B පැකේජය වෙනුවෙන් රු. මිලියන 106.65ක් සහ C පැකේජය වෙනුවෙන් රු. මිලියන 106.35ක් අය කර ගෙන තිබුණි. | ව්‍යාපෘති අධ්‍යක්ෂ කොන්ත්‍රාත් ගිවිසුමේ විශේෂ කොන්දේසිවලට (PCOC) අනුකූල වන බවට සහතික විය යුතුය. |
| (ඊ) | සිවිල් වැඩ සඳහා වූ කොන්ත්‍රාත් පැකේජ තුනෙහි BOQ ප්‍රකාරව ගෙවීම් අයිතම 337ක් සඳහා රු. මිලියන 1,296ක් ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් කාලයෙන් වසර 01කට වැඩි කාලයක් ගත වීමෙන් පසු, එම අයිතමයන් සඳහා ව්‍යාපෘතිය මගින් අවසන් අන්තර් ගෙවීම් සහතිකය දක්වා කිසිදු ගෙවීමක් සිදු කර නොතිබුණි. එබැවින් එම ගෙවීම් අයිතම BOQ හි ඇතුළත් කර තිබීම විගණනයේදී ගැටලු සහගත කරුණක් විය. | එකඟ වේ. ඉංජිනේරු ඇස්තමේන්තුව සිදු කළ යුතු ඉදිකිරීම් කටයුතු සඳහා මග පෙන්වීමක් ලෙස යොදා ගනු ලබයි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය විසින් ප්‍රයෝජනයට නොගන්නා අයිතම පිළිබඳ පුරෝකථනය කිරීමට සුදුසු කාලය එළඹ නොමැත. කෙසේ වෙතත්, දෛනික වැඩ අයිතම අවශ්‍ය අවස්ථාවලදී පමණක් භාවිතා කරනු ලබයි. | ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් BOQ අනුමත කිරීමට පෙර අනවශ්‍ය BOQ අයිතම ඇතුළත් වීම වළක්වා ගැනීමට සහතික විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් 2021 අප්‍රේල් 20 වැනි දින පැවැති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ වාර්තාවට අනුව, සේවායෝජකයාගේ අවශ්‍යතාවය මත සූරියකන්ද - රක්වාන මාර්ගය (කි.මී. 18) ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය, එක් කොන්ත්‍රාත් පැකේජයක් සඳහා කිලෝමීටර 06 බැගින් වූ පැකේජ 03 කට බෙදා තිබුණි. ඒ අනුව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව යටතේ A සහ B පැකේජ ප්‍රදානය කර තිබුණු අතර C පැකේජය අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව යටතේ ප්‍රදානය කර තිබුණි.<br><br>කෙසේ වෙතත්, ව්‍යාපෘතිය පැකේජ 03කට බෙදීමට ගත් එම තීරණය නිසා ව්‍යාපෘතියේ මූලික වියදම්, අධීක්ෂණ ගාස්තු, ව්‍යාපෘති පොදුකාර්ය පිරිවැය ඉහළ ගොස් තිබුණි. | එකඟ වේ. මෙම මාර්ගය කඳුකර ප්‍රදේශ හරහා ගමන් කරන අතර කැපූ බෑවුම් වර්ෂාව සඳහා පුළුල් ලෙස විවෘත වුවහොත් නායයෑම් වලට භාජනය වේ. එසේම, මෙම මාර්ගය සිංහරාජ රක්ෂිතයට ආසන්නව පිහිටා ඇති අතර, එම නිසා වසර පුරා වර්ෂාව අපේක්ෂා කෙරේ. ප්‍රධාන ඉදිකිරීම් කටයුතු ඇතුළුව ව්‍යාපෘතියේ පිරිවැය (ආර්ථික අර්බුදයට පෙර ඉංජිනේරු ඇස්තමේන්තුව) මාර්ගයේ කිලෝමීටර් 18 ක දිග සඳහා රු. මිලියන 4327 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. තවද, ඉහත තත්ත්වය යටතේ ඉදිකිරීම් කාලය වසර 3ක් දක්වා දීර්ඝ කළ යුතුය. එහි ප්‍රතිඵලයක් ලෙස, උපදේශන අධීක්ෂණ ගාස්තු වැඩි වන අතර තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය දුර්වල වුවහොත් ව්‍යාපෘතිය අසාර්ථක වීමේ අවදානමක් ඇත. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් RDA විසින් ව්‍යාපෘති කාලසීමාව අඩු කිරීමට තීරණය කරන ලදී.<br><br>ඒ අනුව, එක් එක් කොන්ත්‍රාත්කරු මාර්ගයේ කිලෝමීටර 6ක් සඳහා වගකිව යුතු වන පරිදි ව්‍යාපෘතිය පැකේජ තුනකට බෙදා ඇති අතර ව්‍යාපෘති කාලසීමාව වසර 2 දක්වා අඩු කර ඇත. | කොන්ත්‍රාත්තුව පැකේජවලට බෙදීමට පෙර ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා අදාළ ප්‍රසම්පාදන කමිටුවෙන් නිසි අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඌ) | ප්‍රසම්පාදන කාලසටහනට අනුව, ප්‍රසම්පාදන ආයතනය 2022 ජනවාරි 02 වන විට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණද, ප්‍රසම්පාදන කාලසටහනට අනුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබූ අතර එය ඉදිකිරීම්වල ප්‍රගතිය අඩු වීමට හේතු වේ. | එකඟ නොවේ.<br><br>ලබා දී ඇති පිළිතුරට අනුව, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාලනයෙන් පරිබාහිරව ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සඳහා ණය දෙන ආයතනයෙන් එකඟතාවය ලැබීමේ දැඩි ප්‍රමාදයක් පවතී. | ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ පිළිතුරට අනුව, භාරදීමේ දිනය දීර්ඝ නොකෙරේ. එබැවින් කාලය දීර්ඝ කිරීම් සඳහා ඉඩ ලබා නොදිය යුතුය. |

### 3.3 ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධ ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| විගණනයට ලැබී ඇති තොරතුරුවලට අනුව, ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා ඉඩම් කට්ටි 1515ක් අත්පත් කර ගැනීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතිය මගින් ඉඩම් කට්ටි 789ක් සඳහා පමණක් 38(අ) වගන්තිය නිකුත් කර තිබුණි. කෙසේ වෙතත්, 2023 | ඉහත දක්වා ඇති වගුවට අනුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මුලින් සපයන ලද ප්‍රගමන අනුරේඛන (advance tracing) සටහන්වලට අනුව ඉඩම් කට්ටි 789 | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහිතව සිදු කළ යුතුය. |

| | |
|---|---|
| දෙසැම්බර් 31 දක්වා 17 වැනි වගන්තිය යටතේ කිසිදු ඉඩම් කට්ටියක් සඳහා වන්දි තක්සේරු කර නොතිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ දුර්වල අධීක්ෂණය ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් බලපා ඇති අතර අනාගතයේදී ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට එය අහිතකර ලෙස බලපෑ හැකිය. | ක් අත්පත් කර ගැනීමට නියමිතය. අනතුරුව එම සියලුම ඉඩම් කට්ටි සඳහා 38(A) ගැසට් නිවේදනය නිකුත් කර ඇත. |

## 3.4 පද්ධති හා පාලනයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ගොඩනැගිල්ලේ පළමු මහලේ ව්‍යාපෘති කාර්යාල හතක් පවත්වාගෙන ගොස් තිබුණද මෙම ව්‍යාපෘති හත සඳහා සාධාරණ ලෙස ගොඩනැඟිලි කුලිය බෙදා නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහා රු. මිලියන 10ක කුලියක් ගෙවා තිබුණි. | විවිධ විදේශ ආධාර ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක වේ. එබැවින්, එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් එක් එක් මාසය සඳහා අග්‍රිම සහ ප්‍රතිපාදන ලබා ගැනීමේ හැකියාව මත වියදම් දරනු ලබයි. කෙසේ වෙතත්, 2024 වසරේ සිට මෙය දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිය අතර බෙදා හරිනු ලැබේ. | ගොඩනැගිලි කුලිය තාර්කික පදනමක් මත විභජනය කළ යුතු අතර නිසි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. |

## 3.5 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| | නීති රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අංක 4.1(ආ) වගන්තියට අනුව | ප්‍රසම්පාදන සැලැස්ම රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර නොතිබූ අතර විදේශ ණය දෙන නියෝජිතායතනය විසින් අනුඥාත කර නොතිබුණි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබූ බවද නිරීක්ෂණය විය. | එකඟ වේ. මෙම කාරණය සම්බන්ධයෙන් ක්‍රියා කරන ලෙස ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත උපදෙස් ලබා දෙනු ඇත. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අංක 7.9.2 වගන්තිය | ඇගයීමේදී සාරානුකූලව ප්‍රතිචාර දැක්වූ වූ අඩුම ලංසුව සැලකිය යුතු ආන්තිකයකින් ඉංජිනේරු ඇස්තමේන්තු ඉක්මවන්නේ නම්, ප්‍රසම්පාදන ආයතනය නව ලංසු සලකා බැලිය යුතු අතර එසේ නැතහොත් සතුටුදායක කොන්ත්‍රාත්තුවක් ලබා ගැනීමට උත්සාහ කිරීම සඳහා අඩුම ලංසුකරු සමඟ සාකච්ඡා කළ හැකිය.<br>කෙසේ වෙතත්, ඉහත රජයේ | එකඟ නොවේ. ඉහත ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුව 2021 වර්ෂයේ HSR අනුපාත මත පදනම්ව සකස් කර ඇති අතර මිල ලංසු 2022 මාර්තු 3 වන දින විවෘත කරන ලදී.<br>එබැවින්, ලංසු විවෘත කිරීමේදී ද්‍රව්‍යවල මිල සමඟ සංසන්දනය කිරීමේදී ඉංජිනේරු ඇස්තමේන්තුව බෙහෙවින් වැඩි වනු ඇති බව | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පෙන්වා දී ඇති කරුණු අනුව මිල ඉහළ යෑම් ගණනය කරනු ලබන බව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහතික කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ අදහස වේ. ලංසු තැබීමේ කාලය තුළ ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල සහ ඉන්ධන මිල ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. | |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ අංක 2.12 වගන්තියට අනුව. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයින් එහි පළමු රැස්වීමේදී ප්‍රකාශ පත්‍රයකට අත්සන් කර නොතිබුණි. | එකඟ වේ. දැනට ප්‍රසම්පාදන කටයුතුවල නිරතව සිටින තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයින් විසින් ප්‍රකාශ පත්‍ර අත්සන් කිරීමට කටයුතු යොදා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

**3.6 භෞතික පරීක්ෂාවේදී කරන ලද නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිරිවිතර 103.4 අනුව රථවාහන ආරක්ෂාව සහ පාලන උපාංග කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතු අතර පැකේජ තුනකට අවසන් අන්තර් ගෙවීම් සහතිකය දක්වා රු. මිලියන 14 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, වැඩ බිම් පරීක්ෂාවේදී, එවැනි උපාංග සවි කර නොතිබීම වැනි බොහෝ ස්ථානවල සෑහීමකට පත් නොවන ආරක්ෂක තත්ත්වයන් නිරීක්ෂණය විය. එබැවින් ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන නොමැතිකම හේතුවෙන් මහජනතාව දැඩි අපහසුතාවට පත්වන බව නිරීක්ෂණය විය. | එකඟ වේ. කෙසේ වෙතත්, සියලුම කොන්ත්‍රාත්කරුවන් මහජන ආරක්ෂාව වැඩිදියුණු කිරීම සහ මහජන අපහසුතාවයන් අවම කිරීම කෙරෙහි ඔවුන්ගේ ප්‍රමුඛ අවධානය යොමු කර ඇත. ඔවුන් වැඩ බිම් අධීක්ෂණය කිරීම සඳහා එක් කොන්ත්‍රාත්තුවකින් ආරක්ෂක නිලධාරීන් තිදෙනකු බැගින් වෙන් කර ඇති අතර ආරක්ෂාව පවත්වාගෙන යාමට උපරිම උත්සාහයක් දරනු ලබයි. | ක්ෂේත්‍ර පරීක්ෂා කිරීමේදී ඉංජිනේරුවන් විසින් ලොග් සටහන් තබා ගත යුතු අතර ඒ අනුව ගෙවීම් අඩු කළ යුතුය. |
| (ආ) | ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මාර්ග දෙපස,මාර්ග ඉවුරුවල සහ කාණුවල පස් ඛාදනය වන ස්ථාන කිහිපයක් සහ මාර්ග උරහිස් පස්වලින් පිරී ඇති ස්ථාන කිහිපයක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, නිසි ආරක්ෂක විධිවිධාන යොදා නොතිබුණි. | එකඟ වේ. මාර්ගයේ කඳු සහිත ස්වභාවය හේතුවෙන් මාර්ගයේ ස්ථාන කිහිපයක සුළු ඛාදනයන් සිදුවන අතර එමඟින් කාණු සහ උරහිස් පස්වලින් අවහිර වේ. මෙම ස්ථාන හැකි ඉක්මනින් යථා තත්වයට පත් කිරීමට කොන්ත්‍රාත්කරුවන් නිරතුරුව පැමිණේ. කෙසේ වෙතත්, මෙම ස්ථානවල ආරක්ෂක විධිවිධාන වැඩිදියුණු කරන ලෙස කොන්ත්‍රාත්කරුවන් තිදෙනාටම උපදෙස් ලබා දී ඇත. | වැඩ ආරම්භ කර කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව නිරීක්ෂණය කිරීමට උපදෙස් දිය යුතුය. |
| (ඇ) | සූරියකන්ද - රක්වාන ව්‍යාපෘතිය යටතේ මාර්ග ඉදිකිරීම් කටයුතු 2022 ඔක්තෝබර් 17 දින ආරම්භ කර 2024 ඔක්තෝබර් 16 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. දැනට පවතින අඩු ප්‍රගතිය අනුව, මුල් නිම කිරීමේ දිනය වන 2024 ඔක්තෝබර් 16 දිනට පෙර | එකඟ වේ. කොන්ත්‍රාත් ගිවිසුමේ සැලසුම් කළ ප්‍රගතිය සහ සත්‍ය භෞතික ප්‍රගතිය අතර සැලකිය යුතු පරතරයක් ඇත.<br><br>(ආ) ප්‍රමාද වූ ප්‍රගතිය ආවරණය කර ගන්නා ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දෙන ලදී. | 1.2.2(ඇ) ඡේදයේ පිළිතුර සහ මෙම පිළිතුර අතර වෙනසක් ඇත. කාලය දීර්ඝ කිරීම් ප්‍රදානය කිරීමට පෙර ව්‍යාපෘති කළමනාකරණ |

| | | | |
|---|---|---|---|
| | මාර්ගයේ ඉතිරි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට ව්‍යාපෘතියට හැකියාවක් නොමැති බව නිරීක්ෂණය වේ. 2024 පෙබරවාරි 01 දින වන විටද කැණීම් සහ අර්ධ වශයෙන් නිම කරන ලද ව්‍යුහයන් නිරීක්ෂණය කරන ලදී. | තවද, අයහපත් කාලගුණය හේතුවෙන් සියලුම කොන්ත්‍රාත්කරුවන් කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව කාලය දීර්ඝ කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර එම ඉල්ලීම් දැනට ඇගයීමට ලක් කරමින් පවතී. | ඒකකය විසින් අදාළ කාල සීමාව තුළ අසාමාන්‍ය අයහපත් කාලගුණික තත්ත්වයන් ඇති වූ බව තහවුරු කළ යුතුය. |
| (ඈ) | ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ඉදිකිරීම් කටයුතු අතරතුර තේ වගාවට හානි සිදුවී ඇති බවත් පාංශු ඛාදනය හා නායයෑම්වලට ලක්විය හැකි ඉහළ අවදානම් සහිත ස්ථාන ද නිරීක්ෂණය විය. | එකඟ වේ. මෙම මාර්ග කොටස කඳුකර ප්‍රදේශ හරහා ගමන් කරන අතර, පවතින මාර්ගය පුළුල් කිරීමේදී ඉතා ඉහළ බෑවුම් කැපීම් සිදු කර ඇත. ඉහළ බෑවුම් කැපීම් හේතුවෙන් මාර්ගයේ සමහර හුදකලා කොටස්වල සුළු පාංශු ඛාදනයන් සිදුවිය හැක.<br><br>කෙසේ වෙතත්, මෙම ඛාදනයන් ඉතා අවදානම්සහගත ලෙස නොසැලකෙන අතර, ඒවා කාලයත් සමඟ යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.<br><br>කෙසේ වෙතත්, ඒවා අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබා දී ඇත. | සියලුම හානි නිවැරදි කිරීමට පියවර ගත යුතු අතර අවම කිරීමේ ක්‍රියාපරිපාටිය හඳුන්වා දිය යුතුය. |
| (ඉ) | ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් නිකුත් කරන ලද 2021.02.18 දිනැති ලිපියේ මාර්ගෝපදේශ හා යෝජනා අනුව පාංශු ඛාදනය අවම කිරීම සහ ස්ථාවර කිරීම සඳහා ඉදිකිරීම් අතරතුර බෑවුම් කැපීම් ඇති කළ යුතුය. තවද, කැණීම් කරන ලද ද්‍රව්‍ය සහ ඉදිකිරීම් සඳහා භාවිතා කරන කිසිදු අපද්‍රව්‍යයක් ජලය සමඟ මිශ්‍ර වීමට ඉඩ නොතැබිය යුතු අතර කැණීම් කරන ලද පස් සුදුසු බැහැර කිරීමේ ස්ථාන වෙත ප්‍රවාහනය කළ යුතු අතර ඛාදනයට නිරාවරණය නොකළ යුතුය. කෙසේ වෙතත්, පස ඛාදනය වන ස්ථාන සහ දුර්වල ජලාපවහන පහසුකම් නිරීක්ෂණය විය. | එකඟ වේ. සියලුම නුසුදුසු පස් සහ අපද්‍රව්‍ය ව්‍යාපෘති භූමිය තුළ සහ ව්‍යාපෘතියෙන් පිටත පිහිටි මධ්‍යම පරිසර අධිකාරියේ අනුමත බැහැර කිරීමේ අංගන වෙත බැහැර කර ඇත.<br><br>පාංශු ඛාදනය නිසා සිදුවන ජල දූෂණය අවම කිරීමට කොන්ත්‍රාත්කරුවන් සෑම උත්සාහයක්ම ගෙන ඇත. කෙසේ වෙතත්, ප්‍රදේශයේ කඳුකර ස්වභාවය නිසා, මාර්ගය පුරා කුඩා දිය පහරවල් රාශියක් ඇති අතර, ජල දූෂණය සම්පූර්ණයෙන්ම වළක්වා ගැනීම අභියෝගාත්මක වේ.<br><br>එසේ වුවද, මෙම ගැටළු අවම කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දී ඇත. | සියලුම හානි නිවැරදි කිරීමට පියවර ගත යුතු අතර අවම කිරීමේ ක්‍රියාපරිපාටිය හඳුන්වා දිය යුතුය. |
| (ඊ) | මහජන පැමිණිලි 12කට විසඳුම් ලබා දී නොමැති බව එම ස්ථාන නැරඹීමේදී නිරීක්ෂණය විය. මන්දගාමී ප්‍රගතිය සහ මහජන පැමිණිලි කඩිනමින් නොවිසඳීම හේතුවෙන් සාමාන්‍ය ජනතාව අපහසුතාවයට පත්ව තිබුණි. | එකඟ නොවේ. මෙම සියලු පැමිණිලි කොන්ත්‍රාත් ගිවිසුමේ ඉංජිනේරුවරයා විසින් සේවායෝජකයා සමඟ සාකච්ඡා කර විසඳීම සඳහා පියවර ගෙන ඇත. | මහජන පැමිණිලි විසඳීම කඩිනම් කළ යුතුය. |